# ළමයින්ට එරෙහි හිංසනය - ක්‍රියාකාරකම් අත්පොත

ආයුබෝවන්. මෙම පොත් පිංච ඔබ වැනි ළමයින්ට සහ තරුණයන්ට සිදුවන හිංසනයන් පිළිබඳ ඉගෙන ගැනීමට උදව් කරන්නකි. එතුළින් ඔබට දරුවන්ට සිදුවන හිංසනයන් ආකාර කිහිපයක් පිළිබඳව ඉගෙනීමට ලැබෙනු ඇති අතර එමගින් ඔබට ඇති අවධානම් වඩා පහසුවෙන් හඳුනාගෙන ඒවායින් ආරක්ෂා වීමට පුළුවන.



අපගේ බලාපොරොත්තුව වන්නේ ඔබ පොත් පිංච කියවීමෙන් අනතුරුව මෙම ගැටළු පිළිබඳව හා ඔබේ ප්‍රජාව තුළ දරුවන්ට සිදුවන හිංසනයන් අවම කිරීමට ඔබට කළ හැකි දේ පිළිබඳව වැඩි ඉගෙනීමක් ලබා ගනී යන්නයි. එසේම ළමයින්ව ආරක්ෂිතව තබා ගැනීමට ප්‍රජාවට තුළ කටයුතු කරන පුද්ගලයින් සහ සංවිධාන සොයා ගැනීමට මෙම පොත්පිංච ඔබව පොළඹවනු ඇති බවද අපේ බලාපොරොත්තුවකි.

තවද මෙම පොත් පිංච ක්‍රියාත්මක වීම පිළිබඳව පොත් පිංචක්ද වේ. මෙම පොතෙන් ඔබ ඉගෙනගත් දෑ බෙදා හදා ගැනීම පිණිස තරුණ පුද්ගලයින් නිර්මාණය කරන ලද අගනා අදහස් රැසක් ඔබට සොයා ගත හැකි වනු ඇත. ඔබේ යහළුවන්, පවුල සහ ප්‍රජාව දරුවන්ට එරෙහි හිංසනයන් නැවැත්වීමට සහය දීම පිණිස පොළඹවන්නේය.

## ළමා ජාවාරම

### ගැටළුව

ළමා ජාවාරම හඳුනාගෙන ඇත්තේ සූරාකෑමේ අරමුණින් දරුවෙකු බඳවා ගැනීම, ප්‍රවාහනය කිරීම සහ භාර ගැනීමයි. මෙසේ ජාවාරම් කරන ලද දරුවන් නිරන්තරයෙන් කම්කරුවන් ලෙස ලිංගික සූරා කෑමට සහ මත්ද්‍රව්‍ය වෙළෙඳාමට හෝ යුධමය කටයුතු සඳහා වුවද බලහත්කාරයෙන් යොදවනු ලැබේ. වසරකට මිලියනයකටත් අධික ළමයින් ප්‍රමාණයක් ජාවාරම් කරනු ලැබේ.

### අභියෝගය

ළමා ජාවාරම පිළිබඳව ඔබේ ප්‍රජාවේ දැනුවත් කිරීම වැඩි කිරීම.

### ඔබට උත්සාහ කර බැලිය හැකි කරුණු

- ළමා ජාවාරම පිළිබඳව වීදි නාට්‍යයක් කිරීම
- ඔබේ පොලිස් ස්ථානයට ආරාධනා කොට ඔබේ ළමා සමාජයේ ළමා ජාවාරම පිළිබඳව සාකච්ඡා කිරීමට සහය දීම.

- ළමා ජාවාරමේ අවධානම් පිළිබඳව දෙමාපියන් සමඟ කථා කිරීමට ඔබේ ප්‍රජා නායකයන්ට ආරාධනා කරන්න.

**ඔබේ ක්‍රියාකාරකම් සංග්‍රහය**

ඔබ දැනුවත්. ඔබට පෙළඹවීමක් ඇත. ඔබ ක්‍රියාත්මක වීම අවශ්‍යයි.

ඔබේ අදහස් ලිවීමට පහතින් ඇති ඉඩ භාවිතා කරන්න.

- ඔබ දකින ඔබේ ප්‍රජාවේ ඇති ළමා ජාවාරමේ විවිධ ආකාර අවධානම් මොනවාද ?
- ඔබට සහ ඔබේ මිතුරන්ට ළමා ජාවාරමෙන් ආරක්ෂා විය හැක්කේ කෙසේද ?
- ඔබට උපකාර කිරීමට ඔබේ ප්‍රජාවේ ඇති සම්පත් මොනවාද ?

## කායික අපයෝජනය

කායික අපයෝජනයද ළමයින්ට එරෙහිව සිදුවන හිංසන වර්ගයකි. කායික අපයෝජනය ඕනෑම තැනක සිදුවිය හැක. නිවසේදී, පාසලේදී, වැඩ බිමේදී සහ ඔබේ ප්‍රජාවේ ඕනෑම ස්ථානයකදී එය සිදුවිය හැක. හිංසනයන්ගෙන් ආරක්ෂා වීමට ළමයෙකුට අයිතියක් ඇත.

**අභියෝගය**

කායික අපයෝජනය සහ ගෘහස්ත හිංසනය නිසා දරුවන්ට ඇතිවන හානිදායක බලපෑම පිළිබඳ ඔබේ ප්‍රජාවේ දැනුවත් බව වැඩි කිරීම

**ඔබට උත්සාහ කර බැලිය හැකි කරුණු**

- තම දරුවන්ව අපයෝජනය කරන දෙමාපියන්ගේ හානිකර ආකල්ප පෙන්වන නාට්‍යයක් රචනා කිරීම
- ඔබේ ප්‍රජා නායකයන් සමඟ ළමයින්ට සිදුවන කායික අපයෝජනයේ සෘණාත්මක බලපෑම පිළිබඳ කථා කිරීම සහ ප්‍රජාවේ විවිධ කණ්ඩායම්වල මේ පිළිබඳව සාකච්ඡා කිරීමට ඔවුන්ට දන්වන්න.
- ශාරීරික දඬුවම්වල හා කායික අපයෝජනයේ හානිකර ප්‍රතිවිපාක පිළිබඳ පත්‍රිකා නිර්මාණය කිරීම සහ බෙදා හැරීම

**ඔබේ ක්‍රියාකාරකම් සංග්‍රහය**

- ඔබගේ ප්‍රජාව තුළ ඔබ දකින කායික අපයෝජන ආකාර මොනවාද ?
- ඔබට සහ ඔබගේ මිතුරන්ට කායික අපයෝජනයෙන් ආරක්ෂා විය හැක්කේ කෙසේද ?

## ළමා මෙහෙකාරත්වය

ළමා මෙහෙකාරත්වය ළමයින්ට එරෙහි හිංසනයේ එක් ආකාරයකි. ළමා මෙහෙකරුවන් ගැටළුවක් බවට පත් වී ඇත්තේ එමගින් ඔවුන්ගේ විභවතාවයන් සම්පූර්ණවීම වැළැක්වෙන බැවින් සහ ඔවුන්ගේ කායික සුබසාධනයට උපද්‍රව ඇති වීමට හේතුවෙනි. ලොවපුරා මිලියන 215 කට ආසන්න ළමයින් ළමා මෙහෙකාර සේවයේ යෙදී සිටී.

**අභියෝගය**

ඔබගේ නිවසේ, පාසලේ, රැකියා ස්ථානයේ හෝ ප්‍රජාවේ ළමා මෙහෙකරුවන් පිළිබඳ සංවාදයක් ආරම්භ කිරීම




- ළමා ශ්‍රමිකත්වය පිළිබඳව ගුවන් විදුලි පිටපතක් රචනා කොට ගුවන් විදුලි නාලිකාවකට එය විකාශය කිරීමට ආරාධනා කිරීම
- ඔබගේ නායකයන් මෙම ගැටළුව පිළිබඳව දැනුවත් කිරීම සඳහා ලිපි ලිවීමේ ව්‍යාපාරයක් අරඹන්න.
- දේශීය ව්‍යාපාර ආයතන කරා ගොස් ළමා ශ්‍රමික ගැටළුව පිළිබඳ පත්‍රිකා බෙදා හැරීම

**ඔබේ ක්‍රියාකාරකම් සංග්‍රහය**

- ඔබේ ප්‍රජාවේ ළමා ශ්‍රමිකත්වය පිළිබඳ දැකිය හැකි අවධානම් වර්ග මොනවාද ?
- ඔබට සහ ඔබේ මිතුරන්ට ළමා මෙහෙකාර සේවයෙන් ආරක්ෂා විය හැක්කේ කෙසේද ?
- ඔබට උපකාර කිරීමට ඔබේ ප්‍රජාවේ ඇති සම්පත් මොනවාද ?

## ලිංගික අපයෝජනය

ලිංගික අපයෝජනය දරුවන්ට සිදුවන හිංසන ආකාරයකි. ලිංගික අපයෝජන දූෂණය, අනවශ්‍ය ලිංගික , ලිංගිකත්වය දනවන ආකාරයට ස්පර්ශ කිරීම සහ ලිංගික සූරාකෑම යන විවිධ ආකාරයෙන් හඳුනාගනු ලැබේ. ලිංගික අපයෝජනය නිවසේ, පාසලේ, රැකියා ස්ථානයේ සහ ප්‍රජාවේ යන විවිධ ස්ථාන වල සිදුවිය හැකිය. ගැහැණු දරුවන් මෙන්ම පිරිමි දරුවන්ද ලිංගික අපයෝජනයේ ගොදුරක් බවට පත්විය හැක.

**අභියෝගය**

- ලිංගික අපයෝජනය පිළිබඳව ඔබගේ නිවසේ, පාසලේ, රැකියා ස්ථානයේ සහ ප්‍රජාවේ සංවාදයක් ආරම්භ කිරීම.

**ඔබට උත්සාහ කර බැලිය හැකි කරුණු**

- ළමයින්ගේ සහ තරුණයන්ගේ දෘෂ්ටිකෝණයෙන් ලිංගික අපයෝජන ගැටළුව ආමන්ත්‍රණය කරන පෝස්ටර් නිර්මාණය කිරීම
- ලිංගික අපයෝජන වලින් වැළැක්වෙන ආකාරය ගැන ළමයින්ට ඔවුන්ගේ අදහස් බෙදා හදා ගත හැකි ලිංගික අපයෝජන විරෝධී ළමා සමාජ ඔබේ පාසලේ පිහිටුවීම
- ලිංගික අපයෝජන වැළැක්වීම අරමුණු කරගත් ප්‍රජා සංවිධාන හඳුනාගෙන පාසලේ හෝ ප්‍රජාවේ ඒ පිළිබඳව කථා කිරීමට ඉල්ලා සිටීම

**ඔබේ ක්‍රියාකාරකම් සංග්‍රහය**

- ඔබේ ප්‍රජාවේ දැකිය හැකි ලිංගික අපයෝජන වලට අදාළ හිංසන ආකාර මොනවාද ?
- ඔබ සහ ඔබේ මිතුරන් ලිංගික අපයෝජන වලින් ආරක්ෂා වන්නේ කෙසේද ?
- ඔබේ ප්‍රජාවේ ඇති ඔබට උපකාර වන සම්පත් මොනවාද ?

## මත්ද්‍රව්‍ය අපයෝජනය

මත්ද්‍රව්‍ය අපයෝජනය බොහෝ ප්‍රජාවන් වල වර්ධනය වෙමින් පවතින ප්‍රශ්නයකි. මත්ද්‍රව්‍ය වෙළෙන්ඳන් වීදි දරුවන්ව ඉලක්ක කරන්නේ ඔවුන්ට අපහසු අවස්ථා වලදී උදව් උපකාර කරමිනි. මත්ද්‍රව්‍ය ආශ්‍රිත හිංසනය සහ මත්ද්‍රව්‍ය අපයෝජනය නිසා දරුවන්ගේ සහ ඔවුන්ගේ ප්‍රජාවන් වල සෞඛ්‍යයට ප්‍රබල බලපෑම් ඇති කරයි.

**අභියෝගය**

ඔබේ මිතුරන් අතර ඔබේ ප්‍රජාවේ ඇති මත්ද්‍රව්‍ය උවදුරේ හානිකර බලපෑම් පිළිබඳ දැනුවත් බව වැඩි කිරීම.

**ඔබට උත්සාහ කර බැලිය හැකි කරුණු**

- දැනුවත් කිරීම සඳහා සංගීත ප්‍රසංගයක් සංවිධානය කිරීම
- මත්ද්‍රව්‍යවල ඇති සෘණාත්මක බලපෑම පිළිබඳ පෝස්ටර් නිර්මාණය කිරීම සහ ඔබේ ප්‍රජාව තුළ ඒවා තැපැල් මාර්ගයෙන් බෙදා හැරීම. ඔබේ මිතුරන් පදිංචිව සිටින ප්‍රදේශ වලට ඒවා බෙදා හැරීම
- ඔබේ ප්‍රජාවේ දරුවන්ට මත්ද්‍රව්‍ය නිසා ඇතිවන බලපෑම පිළිබඳව ලිපියක් රචනා කිරීම. ඔබේ පුවත්පත් වල එය පළ කිරීමට ඉල්ලීම් කරන්න.

**ඔබේ ක්‍රියාකාරකම් සංග්‍රහය**



- ඔබේ ප්‍රජාව තුළ මත්ද්‍රව්‍ය අපයෝජනයට අදාළව ළමයින්ට සිදුවන හිංසන ආකාර මොනවාද?
- ඔබට සහ ඔබේ මිතුරන්ට මත්ද්‍රව්‍ය අපයෝජනයෙන් ආරක්ෂා විය හැක්කේ කෙසේද?
- ඔබට උපකාරී වීමට ඔබේ ප්‍රජාවේ ඇති සම්පත් මොනවාද?

## ළමා විවාහ

සෑම වසරකම මිලියන 10ක් ගැහැණු ළමයින් අවුරුදු 18ට පෙර විවාහ වේ. ළමා විවාහ යනු ළමයින්ට එරෙහි හිංසනයන්ගෙන් එක් ආකාරයකි. අඩු වයසින් විවාහ වන ගැහැණු ළමුන්ට ඔවුන්ගේ උපරිම විභවතාවයන්ට ළඟා වීමේ සහ දුප්පත්කමින් මිදීමේ අවස්ථාවන් අහිමි වේ.

**අභියෝග**

ඔබේ ප්‍රජාව තුළ ළමා විවාහ පිළිබඳ දැනුවත් බව වැඩි කිරීම

**ඔබට සලකා බැලිය හැකි කරුණු**

- ළමා විවාහ පිළිබඳ දැනුවත් කිරීමට ව්‍යාපාරයක් නිර්මාණය කිරීම
- ළමා විවාහ පිළිබඳව ප්‍රජා නායකයන් සමඟ සාකච්ඡා කිරීමට ඔබේ ළමා සමාජ නායකයින්ට පවසන්න
- ළමා විවාහ පිළිබඳ නාට්‍ය පිටපතක් ලියා එය ඔබේ ප්‍රජාවට රඟ දක්වා පෙන්වන්න

**ඔබේ ක්‍රියාකාරකම් සංග්‍රහය**

- ළමා විවාහයන්ට සම්බන්ධව ඔබේ ප්‍රජාවේ දරුවන්ට සිදුවන හිංසනයන් මොනවාද?
- ඔබට සහ ඔබේ මිතුරන්ට ළමා විවාහ වලින් ආරක්ෂා වීමට හැක්කේ කෙසේද?
- ඔබට උපකාර වීමට ඔබේ ප්‍රජාවේ ඇති සම්පත් මොනවාද?

## ළමා හිංසනය

ළමයෙකුට සරදම් කිරීම, විවේචනය කිරීම, බිය ගැන්වීම හෝ විවිධ නම් වලින් ඇමතීම එම ළමයාට සිදු කරන හිංසනයක් වන අතර එය ළමා හිංසනය නම් වේ. “වෙනස්කම්” හෝ හැකියාවන් අඩුවීම

ළමා හිංසනයට පත්වීමට හේතුවක් නොවේ. සෑම ළමයෙකුටම ගෞරවනීය සැලකුම් ලැබීමට අයිතියක් ඇත.

**අභියෝගය**

ඔබේ පාසල තුළ ළමා හිංසනය පිළිබඳව දැනුවත් බව ඉහළ නැංවීම

**ඔබට සලකා බැලිය හැකි කරුණු**

- ඔබේ පන්තියේ මිතුරන්ට ළමා හිංසනය පිළිබඳව ඉදිරිපත් කිරීමක් කරන්න. ගුරුවරුන්ට, අනුශාසකයන්ට සහ පුහුණුකරුවන්ට එයට ආරාධනා කරන්න. එවිට ළමයින් ළමා හිංසනය පිළිබඳව දකින ආකාරය පිළිබඳව ඔවුන්ටද අවබෝධ කරගත හැකිවනු ඇත.
- ළමා හිංසනය පිළිබඳව සහ එය නැවැත්විය හැකි ආකාරය පිළිබඳව ඔබේ මිතුරන්ට කථා කරන්න. ඔවුන්ගේ මිතුරන්ටද ඒ පිළිබඳව කථා කරන ලෙස දන්වන්න.

**ඔබේ ක්‍රියාකාරකම් සංග්‍රහය**

- ඔබේ ප්‍රජාව තුළ දැකිය හැකි ළමා හිංසන ආකාර මොනවාද?
- ළමා හිංසනයෙන් ඔබට සහ ඔබේ මිතුරන්ට ආරක්ෂා විය හැක්කේ කෙසේද?
- ඔබට උදව් කිරීමට ඔබේ ප්‍රජාවේ ඇති සම්පත් මොනවාද?

## වාචික අපයෝජනය

වාචික අපයෝජනය ළමයින්ට සිදුවන හිංසනයන්ගේ තවත් ආකාරයකි. ළමයින් පාසලේදී වුවද නුසුදුසු ආකාරයේ හඬනගා කෑගැසීම් වලට හා බැණ වැදීම් වලට භාජනය නොවිය යුතුය. ළමයින් ගෞරවනීය ලෙස සහ ප්‍රවේශමෙන් සැලකිය යුතුය.

**අභියෝගය**

වාචික අපයෝජනය පිළිබඳව පාසලේ හෝ නිවසේ දැනුවත්බව වැඩි කිරීම

- ඔබේ පන්තියේ මිතුරන්ට වාචික අපයෝජනය පිළිබඳව ඉදිරිපත් කිරීමක් කරන්න.
- ගෞරවනීය ලෙස ඉගැන්වීම පිළිබඳව ගුරුවරුන් සමඟ රැස්වීමක් සංවිධානය කරන්න.
- පාසලේ රැලියක් සඳහා දැන්වීම් පුවරු නිර්මාණය කරන්න

**ඔබේ ක්‍රියාකාරකම් සංග්‍රහය**

- ප්‍රජාව තුළ දරුවන්ට සිදුවන වාචික අපයෝජනයේ විවිධ ආකාර මොනවාද?
- ඔබට සහ ඔබේ මිතුරන්ට වාචික අපයෝජනයෙන් ආරක්ෂා විය හැක්කේ කෙසේද?
- ඔබට උපකාර වීමට ප්‍රජාවේ ඇති සම්පත් මොනවාද?

**වැඩිපුර අදහස් සඳහා සංඥා**

ඉතින් ඔබ ක්‍රියාත්මක වීම සඳහා සූදානම්. නමුත් ඔබ ව්‍යාපෘතිය සඳහා ඔබේම අදහස් නිර්මාණය කිරීමට උත්සාහ දැරීම අවශ්‍යයි. ඔබට ආරම්භය සඳහා උදව් කිරීමට සංඥා කිහිපයක් මෙන්න.

- ඔබ ව්‍යාපෘතිය නිර්මාණය කිරීමට යන පුද්ගලයන්ගේ සිතුවිලි සහ හැඟීම් පිළිබඳව සිතන්න. අනෙක් අය සිතන්නේ කුමක්විය හැකිද යන්න හෝ ඔවුන්ට අවශ්‍ය වන්නේ කුමක්ද යන්න ඔබ සිතන විට ඔවුන් භාවිතයට ගන්නා මෙවලම් නිර්මාණය කිරීම හෝ ඔවුන් ඇහුම්කන් දෙන පණිවිඩ නිර්මාණය කිරීම පහසුය.
- සියලුම අදහස්වල ඒ පිළිබඳ හොඳ දෙයක් ඇත. ඔබේ අදහස් ඉක්මනින් විනිශ්චය කොට ඔබවම සීමා කර නොගන්න.
- ඔබට හැකි තරම් අදහස් සමඟින් ඉදිරියට එන්න. පසුව ඔබට හොඳම අදහස් තෝරාගත හැකිවනු ඇත.
- ඔබේ අදහස් හැඩගස්වන්න.

